# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(II) *සහ* ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021(I)

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(II) *සහ* ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2021(I) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණය සහ මෙහෙයවීම යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් **2025.10.04** දින සිට **2025.10.19** දින දක්වා සති අන්ත දිනවල **කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. ඉහත සේවාවලට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග පරීක්ෂණය පහත සඳහන් පරිදි වේ. :

| *අනු අංකය* | *විභාගයේ නම* | *සංකේත නාමය* |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAS 1 |
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLES |
| 03 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLSS |
| 04 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLArS |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAcS 1 |
| 06 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLPS 1 |
| 07 | ඉහත විභාගයට ඉල්ලුම් කළ හැකි වෙනත් සේවාවන් | other |
| 08 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAS 2 |
| 09 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLAcS 2 |
| 10 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | SLPS 2 |

03. තමා කැමති නම් එක් එක් විෂය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරින්ට හැකිවේ. එතෙකුදු වුවත් නියම කර ඇති කාල සීමාව තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම අත්‍යාවශ්‍ය වේ.

04. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

05. මෙම විභාගය සඳහා අයදුම් කිරීම අන්තර්ජාලය හරහා මාර්ගගත ක්‍රමයට (Online) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියවන www.slida.lk වෙත පිවිසීමෙන් පමණක් කළ හැක. වෙබ් අඩවියේ මුල් පිටුවේ ("Apply for Examinations: Click Here.") දිගුව ඔස්සේ හෝ සෘජුව https://examinationportal.slida.lk/application වෙත පිවිස ඔබ විසින් පරිශීලක ගිණුමක් (User Account) සකස් කර ගත යුතු අතර ඉන්පසු විභාග අයදුම්පත සම්පූර්ණ කළ හැක. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය.

විභාග අයදුම්පත සම්පූර්ණ කිරීම **2025.08.22** දින පෙ.ව. **8.00** සිට **2025.09.05** දින රාත්‍රී **12.00** දක්වා වන කාලය තුළ පමණක් සිදු කළ හැක.

06. i. විභාග ගාස්තු - පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. මීට පෙර විභාගයට අයදුම්කර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලදුව විභාගයට පෙනී නොසිටිය ද එය විභාගයට පෙනී සිටි වාරයක් ලෙස සැලකිය යුතු ය.

ii. මීට පෙර විභාගයට පෙනී සිටි නිලධරයන්, පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු වේ. :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය එක් විභාගයක් ලෙසත්, දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය තවත් විභාගයක් ලෙසත් සලකා විභාග ගාස්තු ගෙවිය යුතුය. ඒ අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට පමණක් අයදුම් කරන්නේ නම් රු.500 ක විභාග ගාස්තුවකුත් එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු. 1,000 ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ එක් විෂයයකට පමණක් අයදුම් කරන්නේ නම් රු. 500 ක විභාග ගාස්තුවකුත් එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු.1,000 ක විභාග ගාස්තුවක් ද ගෙවිය යුතු වේ.

iii. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරින් සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයන්හි එක් විෂයයකට පමණක් අයදුම් කරන්නේ නම් රු.500 ක විභාග ගාස්තුවකුත් එක් විෂයයකට වඩා අයදුම් කරන්නේ නම් රු.1000 ක විභාග ගාස්තුවකුත් ගෙවිය යුතු වේ.

iv. විභාග ගාස්තු පහත දැක්වෙන ගිණුම වෙත බැර කළ යුතුවේ. :

ගිණුමේ නම - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
ගිණුම් අංකය - 310100119027430
බැංකුව - මහජන බැංකුව - බම්බලපිටිය ශාඛාව

එම ගෙවීමට අදාළව ලබා දෙන මුදල් තැන්පතු පතේ අංකය අයදුම්පතට ඇතුළත් කළ යුතු අතර මුදල් තැන්පතු පතේ ඡායාරූපයක් විභාග අයදුම්පතේ අදාළ ස්ථානයට උඩුගත (Upload) කළ යුතුය.

v. තවද ගිණුම වෙත මුදල් ගෙවීමේ දී මුදල් ගෙවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, මුදල් තැන්පත් කිරීමට හේතුව යන ස්ථානයේ ඔබට අදාළ විභාගයේ සංකේත නාමය ද ඇතුළත් කර මුදල් තැන්පතු පත සම්පූර්ණ කළ යුතුය (සංකේත නාම 02 වගන්තියේ දක්වා ඇති පරිදි විය යුතුය.) මාර්ගගත (Online) ක්‍රමයට මුදල් ගෙවන නිලධාරින් ද ලැබෙන රිසිට්පතේ ඉහත තොරතුරු සටහන් කළ යුතුය.

**සටහන**

මෙම විභාගය රජයේ විධායක ගනයේ නිලධරයන් වෙනුවෙන් පවත්වනු ලබන විභාගයකි. එබැවින් තම අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී නිවැරදි තොරතුරු ඇතුළත් කරනු ඇතැයි ද විභාග ගාස්තු ගෙවීමේ දී නිසි පරිදි සහ අදාළ පරිදි එම ගාස්තු ගෙවනු ඇතැයි ද විභාග අපේක්ෂකයින් වෙතින් තරයේ අපේක්ෂා කෙරේ. එබැවින් අයදුම්කරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළු වැදගත් තොරතුරු වැරදියට ඇතුළත් කිරීම, එකම අයදුම්කරු විභාග අයදුම්පත් කිහිපයක් ඉදිරිපත් කිරීම, අදාළ නොවන සේවාවක් විභාගය සඳහා තෝරා ගැනීම, මුහුණ දෙන විභාග වාරය සම්බන්ධයෙන් ව්‍යාජ තොරතුරු ඇතුළත් කිරීම සහ නිසි පරිදි විභාග ගාස්තු නොගෙවීම වැනි කරුණු අනාවරණය වුවහොත් එම අයදුම්කරුවන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. එම ක්‍රියාමාර්ගය විභාග ප්‍රතිඵල අත්හිටුවීමක්, අපේක්ෂකත්වය අවලංගු කිරීමක් හෝ නිදහසට කරුණු විමසීමක් අවසානයේ පනවනු ලබන වෙනත් විනය දඬුවමක් හෝ විය හැකි බව අවධාරණය කරනු ලැබේ.

07. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම.

මාර්ගගත ක්‍රමයට (Online) අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී අයදුම්කරු සතුව සක්‍රීය විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයක් හා ජංගම දුරකථන අංකයක් පැවතීම අනිවාර්යය වේ. (අයදුම් කිරීමේ දී එක් විද්‍යුත් තැපැල් ලිපිනයක් භාවිතා කළ හැක්කේ එක් පරිශීලක ගිණුමක් සඳහා පමණි.) අයදුම්පත්‍රය මාර්ගගතව (Online) යොමු කළ පසු, එය ලැබුණු බව තහවුරු කිරීමේ පණිවිඩයක් විද්‍යුත් තැපැල් ලිපිනයට හා ජංගම දුරකථන අංකයට යොමු කෙරෙනු ඇත.

විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ විගස ඒ බැව් ඔබ විසින් ලබා දී ඇති ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. එවිට ඔබ විසින් සකස් කරගත් පරිශීලක ගිණුම වෙත පිවිස විභාග ප්‍රවේශ පත්‍රය භාගත (Download) කරගත හැක.

අයදුම්පතේ සඳහන් කරනු ලබන අයදුම්කරු සම්බන්ධ කර ගැනීමේ මාර්ග වන ජංගම දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය විභාගය අවසන් වනතුරු සක්‍රීයව පවත්වා ගැනීම අයදුම්කරු සතු වගකීමකි. ජංගම දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනය වෙනස් කිරීම හේතුවෙන් ඇතිවන අපහසුතාවයන් සම්බන්ධ වගකීම අයදුම්කරුවන් සතුවේ. විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් විභාග අපේක්ෂකයින් විසින් තම පෞද්ගලික ලිපි ගොනුවේ ඇතුළත් කිරීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ලබා දිය යුතුය.

***සටහන* :** මාර්ගගත අයදුම්පත පිරවීමේ දී පෞද්ගලික ලිපිනය, සේවය කරන ආයතනය හා සේවා ස්ථානයේ ලිපිනය පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

08. අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් යම් ගැටළුවක් මතු වුවහොත් ඒ පිළිබඳ විමසීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ 011-5980236/ 011-5980264 හා 011-5980263 යන දුරකථන අංක ඔස්සේ **2025.08.22 දින සිට 2025.09.05** දින දක්වා සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 08.30** සිට **ප.ව. 04.30** දක්වා විවෘතව ඇත.

09. විභාග ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතුය. අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය තහවුරු කර ගැනීමට අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-5980236 ඔස්සේ ඒ බව තහවුරු කර ගත හැකිය. විභාගයට පැමිණීම වෙනුවෙන් ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව - අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය වලින් මෙම විභාගය පැවැත්වෙන අතර යම් අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොමැත.

12. විභාග පරිපාටිය - එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහාවන විෂයය සහ විෂය නිර්දේශ පහත සඳහන් පරිදි වේ.

සෑම ප්‍රශ්න පත්‍රයකටම කාලය පැය තුනකි. (03) අයදුම්කරුවකු මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වීම සඳහා සෑම විෂයයක් සඳහාම අවම වශයෙන් ලකුණු හතලිහක් (40) ලබාගත යුතුය.

12.1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරින් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය: (අංක 1842/2 හා 2013.12.23 දිනැති අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'උ' පරිශිෂ්ටය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ.

| අනු අංකය | විෂයය | | කාලය | විෂයය අංකය |
|---|---|---|---|---|
| 01 | නීතිය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | පැය 03යි | 01 - I |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | පැය 03යි | 01 - II |
| | | අපරාධ නීතිය හා සාක්ෂි නීතිය | පැය 03යි | 01 - III |
| 02. | පරිපාලනය | | පැය 03යි | 02 - I |
| 03 | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව | | පැය 03යි | 03 |
| 04 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | | පැය 03යි | 04 |

12.1.1 නීතිය

පහත සඳහන් කරුණු පදනම්වන ප්‍රශ්න පත්‍ර 03 කි.

පළමුවන (I) ප්‍රශ්න පත්‍රය -

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (විෂයය අංකය 01-I) (ලකුණු 100 යි)

(i) ඓතිහාසික සංවර්ධනය ද ඇතුලුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා 1978 ජනරජ ව්‍යවස්ථාව
(ii) විධායකය, ජනරජයේ ජනාධිපති, අගමැති, අමාත්‍ය මණ්ඩලය හා රාජ්‍ය සේවය
(iii) යුක්තිය පසිඳලීම
(iv) පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය
(v) රාජ්‍ය ප්‍රතිපත්ති උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හා මූලික යුතුකම්
(vi) අභිනියෝජන ව්‍යවස්ථා
(vii) රජයේ හා රාජ්‍ය අධිකාරීන්ගි වගකීම
(viii) මූලික අයිතිවාසිකම්

දෙවන (II) ප්‍රශ්න පත්‍රය -

ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (විෂයය අංකය 01-II) (ලකුණු 100 යි)

(i) යුක්තිය පසිඳලීම
(ii) ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය
(iii) අධිකරණ සංවිධාන
(iv) ශ්‍රී ලංකාවේ උසාවි ආඥා පනත (6 පරිච්ඡේදය)
(v) 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත

තුන්වන (III) ප්‍රශ්න පත්‍රය -

අපරාධ නීතිය හා සාක්ෂි නීතිය (විෂයය අංකය 01-III) (ලකුණු 100 යි)

(i) දණ්ඩ නීති සංග්‍රහය
(ii) සාක්ෂි ආඥා පනත

අපේක්ෂකයෙකු නීති විෂය සමත් වීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයකට ම අවම වශයෙන් ලකුණු තිස්පහක් (35) හා මුළු ලකුණුවලින් සියයට හතලිහක (40%) සාමාන්‍යයක් ලබාගත යුතුය.

12.1.2 පරිපාලනය (විෂයය අංකය 02-I)- (ලකුණු 100 යි)

පහත සඳහන් කරුණු පදනම්වන එක් ප්‍රශ්න පත්‍රයකි.-

(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම

(ii) ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද
I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.

12.1.3 ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව (විෂයය අංකය 03) - (ලකුණු 100 යි)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

පළමු (I) කොටස - ආර්ථික විද්‍යාව

(i) වටිනාකම, නිෂ්පාදනය හා බෙදා හැරීමේ න්‍යායන් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ආර්ථික විද්‍යාවේ මූලධර්ම
(ii) මුදල්, නිෂ්පාදනය හා බෙදාහැරීම
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය පිළිබඳ අවධානයක් සහිතව ශ්‍රී ලංකා ආර්ථික පසුබිම හා ආර්ථික සංවර්ධනයට අදාළ ප්‍රතිපත්ති උපාය මාර්ග හා වැඩ සටහන්

දෙවන (II) කොටස - සමාජ විද්‍යාව

(i) සමාජ ව්‍යුහය සංවිධානය හා කාර්යයන්
(ii) මානව සම්බන්ධතා හා කණ්ඩායම්
(iii) බන්ධුත්වය, විවාහය හා පවුල
(iv) ග්‍රාමීය හා නාගරික සමාජය
(v) සමාජ ස්ථරායනය හා විභේදනය
(vi) සමාජීය පාලනය
(vii) සංස්කෘතිය, ආගම, සදාචාරය හා හර පද්ධතීන්

අපේක්ෂකයෙකු ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව විෂයය සමත් වීම සඳහා එක් එක් කොටසට අවම වශයෙන් ලකුණු විස්ස (20) බැගින් ලබාගත යුතුය.

12.1.4 රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (විෂයය අංකය 04 - ලකුණු 100 යි)

පහත සඳහන් කරුණු පදනම්වන එක් ප්‍රශ්න පත්‍රයකි.-

(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන
- රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
- අරමුදල් යන්නෙහි අර්ථය
- ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය
- විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
- අවිනිශ්චිත අවස්ථා අරමුදල
- වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරීත්වය
- රාජ්‍ය ආදායම
- මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය
- භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
- වොරන්ට් හා අග්‍රිම අධිකාරිය
- විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය

- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

(ii) ගණන් දීමේ නිලධාරින්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරින් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරින් පත් කිරීම, එම නිලධාරින්ගේ බලතල හා කාර්ය භාරය/ වගවීම් හා වගකීම් ස්වභාවය

(iii) අභ්‍යන්තර විගණනය

(iv) රාජ්‍ය වියදම් සැලසුම්කරණය හා කළමනාකරණය
- සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම
- රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනා ගැනීම
- සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම් ප්‍රමුඛතාකරණය
- වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තුව සැකසීම සහ අවසන් තීරණ ගැනීම

(v) අනුමත ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම
- වීරමෝං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
- මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
- පරිපූරක ඇස්තමේන්තු

(vi) රජයේ දේපළවල පාඩු හා අත් හැරීම්
(vii) විවිධ ගිණුම් කටයුතු
(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම
(ix) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය
(x) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
- රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

12.2 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (අංක 1836/6 හා 2013.11.11 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ III උපලේඛනය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහාවන විෂයයන් පහත දැක්වේ.-

| *අනු අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | පරිපාලනය | පැය 03යි | 02 – II |
| 02 | මූල්‍ය ක්‍රම | පැය 03යි | 05 - I |
| 03 | දෙපාර්තමේන්තු / ආයතන ක්‍රමවේදයන් | මෙය ආයතන ප්‍රධානියා විසින් පවත්වනු ලබන බැවින් මෙම නිවේදනයේ ඒ සම්බන්ධව තොරතුරු පළ නොවේ. | |

එක් එක් විෂයය සමත්වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ගණන 40 කි.

12.2.1 පරිපාලනය (විෂයය අංකය 02- II - ලකුණු 100යි)

1985 ප්‍රකාශයට පත් කරන ලද ආයතන සංග්‍රහයේ I කාණ්ඩය සහ 1999 ප්‍රකාශයට පත්කරන ලද ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ සියලුම පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යපටිපාටික රීති සංග්‍රහය මත (කාලීන සංශෝධනයන්ට යටත්ව) පදනම් වූ ඉංජිනේරු සේවාවේ කටයුතුවලට අදාළවන සේ සකස් කළ එක් ප්‍රශ්න පත්‍රයකි.

12.2.2 මූල්‍ය ක්‍රම (විෂයය අංකය 05 - I - ලකුණු 100යි)

1992 ප්‍රකාශයට පත්කරන ලද මූල්‍ය රෙගුලාසි හි IX හා X පරිච්ඡේද හැර අනෙකුත් සියළුම පරිච්ඡේද සහ ජාතික ප්‍රසම්පාදන මාර්ග දර්ශක සංග්‍රහය (කාලීන සංශෝධනයන්ට යටත්ව) මත පදනම් වූ ඉංජිනේරු සේවාවේ කටයුතුවලට අදාළවන සේ සකස් කළ එක් ප්‍රශ්න පත්‍රයකි.

12.3 ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය (2014.08.28 දිනැති අංක 1877/27 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 4 වන පරිශිෂ්ඨය);

සහ

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය. (2014.08.28 දිනැති අංක 1877/28 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 4 පරිශිෂ්ඨය)

මෙම විභාගයන් සඳහා විෂයයන් පහත දැක්වේ.-

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| මූල්‍ය ක්‍රම | පැය 03 යි | 05 - II |
| පරිපාලනය | පැය 03 යි | 02 - III |
| දෙපාර්තමේන්තු රෙගුලාසි | මෙය ආයතන ප්‍රධානියා විසින් පවත්වනු ලබන බැවින් මෙම නිවේදනයේ ඒ සම්බන්ධව තොරතුරු පළ නොවේ. | |

12.3.1 මූල්‍ය ක්‍රම (විෂයය අංකය 05 - II - ලකුණු 100යි)

පහත සඳහන් කරුණු පදනම් වන එක් ප්‍රශ්න පත්‍රයකි.-

(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන
- රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය
- අරමුදල් යන්නෙහි අර්ථය
- ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය
- විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම
- අවිනිශ්චිත අවස්ථා අරමුදල
- වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරීත්වය
- රාජ්‍ය ආදායම
- මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්යභාරය
- භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය
- වොරන්ට් හා අග්‍රිම අධිකාරිය
- විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA)
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

(ii) ගණන් දීමේ නිලධාරීන්, ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන් දීමේ නිලධාරීන් පත් කිරීම, එම නිලධාරීන්ගේ බලතල හා කාර්ය භාරය/ වගවීම් හා වගකීම් ස්වභාවය

(iii) අභ්‍යන්තර විගණනය

(iv) රාජ්‍ය වියදම් සැලසුම්කරණය හා කළමනාකරණය

- සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම
- රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනා ගැනීම
- සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම් ප්‍රමුඛතාකරණය
- වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තුව සැකසීම සහ අවසන් තීරණ ගැනීම

(v) අනුමත ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම
- වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම
- රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය
- මූළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම
- පරිපූරක ඇස්තමේන්තු

(vi) රජයේ දේපළවල පාඩු හා අත් හැරීම්
(vii) විවිධ ගිණුම් කටයුතු
(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම
(ix) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය
(x) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය
- රජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය
- රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

**සටහන :-** මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.3.2 පරිපාලනය (විෂයය අංකය 02- III - ලකුණු 100යි)
පහත සඳහන් කරුණු පදනම්වන එක් ප්‍රශ්න පත්‍රයකි.

(i) ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද
I, II, III, V, VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII හා XLVIII

(ii) අංක 1589/30 දරණ 2009.02.20 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති.

**සටහන :-** මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.4 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (අංක 1670/33 හා 2010.09.10 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 03 වැනි පරිශිෂ්ඨය)
මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහාවන විෂයයන් පහත දැක්වේ.-

| *අනු අංකය* | *විෂය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01. | රජයේ මූල්‍ය පරිපාටි | පැය 03 | 06 |
| 02. | නීතිය හා කළමනාකරණය | පැය 03 | 07 |
| 03. | පරිපාලනය | පැය 03 | 02 - IV |
| 04. | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | පැය 03 | 08 |

12.4 .1 රජයේ මූල්‍ය ක්‍රියා පරිපාටි (විෂය අංක 06 ) ( ලකුණු 100)
රජයේ ගණුදෙනුවලට මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාරයේ චක්‍රලේඛ යොදා ගැනීම, රාජ්‍ය ආදායමට ඇති සම්බන්ධතාව අනුව මුදල් රෙගුලාසි/ක්‍රියා පිළිවෙත්, වියදම්, විදේශ ආධාර, වාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු, රජයේ ණය, සැපයුම් ටෙන්ඩරය, අග්‍රිම හා අත්තිකාරම් මුදල් අනුඥාත, රාජ්‍ය ගිණුම්, කාර්යබද්ධ හා ආර්ථික වර්ගීකරණයන්, වැඩ සටහන් හා කාර්ය සාධන අයවැය, මුදල් අමාත්‍යවරයාගේ කාර්යයන්, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, ලේකම්වරු, විගණකාධිපති හා රජයේ ගිණුම් කමිටුව සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර චක්‍රලේඛ යොදා ගනු ලබන ආකාරය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනීම පරීක්ෂා කෙරේ.

**12.4.2 නීතිය හා කළමනාකරණය (විෂය අංක - 07 ) ( ලකුණු 100)**

නීතිය : නීතිය පිළිබඳ නිර්වචනය
ශ්‍රී ලංකාවේ නීති පද්ධති
ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධති
ගිවිසුම් නීතිය
නියෝජිතායතන නීතිය
භාණ්ඩ විකිණීම
වාරික මුදල් ගෙවීමේ ක්‍රමයට මිල දී ගැනීම
ගනුදෙනු කළ හැකි ලිපිනයන්
ඇප සහතික කිරීම
රක්ෂණය

කළමනාකරණය :
කළමනාකරණය පිළිබඳ හැඳින්වීම
කළමනාකරුවන්ගේ කාර්යයන් හා දක්ෂතා
සැලසුම් ක්‍රියාවලිය හා සංවිධාන මට්ටම් ඇති කිරීම
සංවිධාන ව්‍යුහය
මානව සම්පත් කළමනාකරණය
කාර්ය සාධන ඇගයීම
ප්‍රවර්ධනය
අභිප්‍රේරණය
නායකත්වය
සන්නිවේදනය
තීරණ ගැනීම
ගැටලු නිරාකරණය
වෙනස්වීම් කළමනාකරණය
කළමනාකරණ ගැටුම්
කළමනාකරණ කාලය
තත්ත්ව චක්‍ර හා නිෂ්පාදන හා ඵලය
කළමනාකරණ ආචාරධර්ම හා වගකීම්

**12.4.3 පරිපාලනය (විෂය අංක - 02 - IV ) ( ලකුණු 100)**

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII සහ

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද

**12.4.4 වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම (විෂය අංක - 08) ( ලකුණු 100)**

කළමනාකරණ තොරතුරු සම්බන්ධයෙන් කාලානුරූප වීමේ නිරවද්‍යතාව සහ පරිපූර්ණ බවෙහි වැදගත්කම

ආශ්‍රය තොරතුරු පරිහරණය
කාලානුරූප හා තදුචිත වාර්තා
රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම
කළමනාකරණ වාර්තා ව්‍යුහය
විශේෂයක් දැක්විය යුතු වැදගත් ප්‍රතිඵල
ප්‍රතිඵල අර්ථකථනය
විචල්‍යයන් යෝජනා කිරීම
දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යානාම ක්‍රම භාවිතය
කාර්ය සාධනය සැසඳීම
කළමනාකරණ වාර්තාවල අනුපාත හා ප්‍රතිශත භාවිතය
රේඛා චිත්‍ර මගින් නිරූපණය
වෘත්තීයමය කථා හා දේශනවලට සවන්දීම

කථනයෙන් දේශන වාර්තා කිරීම
විෂය මධ්‍යගත සාකච්ඡා
සම්මන්ත්‍රණ දක්ෂතා
කථා පැවැත්වීම

*සටහන* - සාමාර්ථය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.5 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා පැවැත්වෙන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

(අංක 1670/32 හා 2010.09.10 දිනැති අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහාවන විෂයයන් පහත දැක්වේ:-

| *අනු අංකය* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 03 | 09 |
| 02 | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 03 | 10 |
| 03 | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 03 | 11 |
| 04 | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම | 03 | 12 |
| 05 | ඉංග්‍රීසි භාෂාව | 03 | 13 |

**12.5.1** සේවා ව්‍යවස්ථාවේ හා පත්වීම් ලිපියේ විධිවිධාන පරිදි නියමිත කාල සීමාව තුළ හෝ ඊට පෙර විභාගය සමත් විය යුතු අතර, සියලුම විෂයයන් සඳහා එකම වාරයක දී හෝ වෙන් වෙන් වශයෙන් වාර කිහිපයක දී හෝ පෙනී සිටීමට නිලධාරියකුට අවසර ඇත.

විභාග පටිපාටිය

**12.5.2 ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන (විෂයය අංකය - 09) (ලකුණු 100 යි)**

i. ජාතික පරමාර්ථයන් හා ප්‍රමුඛතාවයන් සහ ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රමසම්පාදන ප්‍රතිපත්ති රාමුව සහ වැඩසටහන්
ii. ජාතික ක්‍රමසම්පාදනය සඳහා විධි ශාස්ත්‍රය ක්‍රමසම්පාදනයෙහි ලා ප්‍රධාන ගැටලු තැන්, පොදු ජන සහභාගිත්වය, සම්පත් යෙදවීම ආදිය
iii. ජාතික ක්‍රමසම්පාදනය සඳහා දත්ත ස්වභාවය සහ මූලාශ්‍ර, දත්ත රැස්කිරීම, අර්ථ නිරූපණය ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය, ක්ෂේත්‍ර අධීක්ෂණ හා විමර්ශන, ජන විකාශ සංකල්ප, ආර්ථික විද්‍යා ප්‍රක්ෂේපණ හා ප්‍රතිපත්ති විශ්ලේෂණ

**12.5.3 ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය (විෂයය අංකය - 10) (ලකුණු 100 යි)**

i. නිපැයුම හා බෙදා හැරීම පිළිබඳ න්‍යායන් කෙරෙහි විශේෂ සැලකිල්ලකින් යුතුව ආර්ථික විද්‍යා මූලධර්ම
ii. මුදල්, බැංකු ක්‍රම, ජාත්‍යන්තර මූල්‍ය ක්‍රම හා වෙළෙඳාම
iii. මූල්‍ය, මුදල්, වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති විශ්ලේෂණය
iv. ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය
v. ආර්ථිකය සමාලෝචනය කිරීම

vi. ශිල්පීය පුහුණු සහ නුපුහුණු මිනිස් බලය සහ විදේශාධාර ඇතුළු වෙනත් සම්පත් තක්සේරු කිරීම සහ ඒවා උපයෝගීකරණය
vii. ආර්ථික විද්‍යාත්මක සහ සමාජයීය සිද්ධි
viii. ආර්ථික විශ්ලේෂණය සහ ක්‍රමසම්පාදනයෙහි ලා උපයෝගී කරගන්නා මූලික සංඛ්‍යානය සංකල්ප හා ක්‍රම
ix. ප්‍රතිලාභ / පිරිවැය විශ්ලේෂණ මූලධර්ම

**12.5.4 ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ පසු විපරම් කටයුතු (විෂයය අංකය - 11) (ලකුණු 100 යි)**

i. ව්‍යාපෘති සැලසුම් කිරීම, හඳුනා ගැනීම සහ නිර්වචනය කිරීම හා ව්‍යාපෘති සම්පාදනය, ප්‍රතිපත්ති, සිද්ධාන්ත, ස්ථානය තෝරා ගැනීම, තාක්ෂණය සහ පිරිවැය සහ ප්‍රතිලාභ ඇස්තමේන්තු කිරීම, තාක්ෂණික මූල්‍ය සහ ආර්ථික විශ්ලේෂණය

ii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම/අධීක්ෂණය, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපලේඛන සැකසීම, පසුවිපරම් සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු

iii. ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩසටහන්වල සාකල්‍යය තක්සේරු කිරීම, පිරිවැයට සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය

**12.5.5 ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම (විෂයය අංකය - 12) (ලකුණු 100 යි)**

i. ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (x පරිච්ඡේදය හැර)

ii. ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VII, IX, XI, XII, XV, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII සහ
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති පළමුවන කාණ්ඩයේ I සිට VI දක්වා පරිච්ඡේද

iii. ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය :- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන, රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය, ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය, විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම, රාජ්‍ය ආදායම, මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්ය භාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්ය භාරය, වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය, විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය, රාජ්‍ය වියදම් කමිටුව, රාජ්‍ය ව්‍යාපාර කමිටුව

iv. ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය

v. රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය, සංවිධානවල අරමුණු හා කාර්යභාරයන් හඳුනා ගැනීම, වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම, අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම, වීරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පරිපූරක ඇස්තමේන්තු

vi. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය :- භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම, ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය, පත්කිරීම්, බලතල හා කාර්ය භාරය, ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියා පටිපාටිය, විදේශ ආධාර මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල කළමනාකරණය

**12.5.6 ඉංග්‍රීසි භාෂාව (විෂයය අංකය - 13) (ලකුණු 100 යි)**

ක්‍රමසම්පාදනය, සංවර්ධනය, සැලසුම්කරණය සහ කළමනාකරණය යන විෂයයන්ට අදාළව අපේක්ෂකයන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය, ඉංග්‍රීසි භාෂා කුසලතාවය මැනීම සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

*සටහන* :- සාමාර්ථය සඳහා අයදුම්කරුවන් සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

12.6 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය:- (අංක 1842/2 හා 2013.12.23 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඌ' පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ:-

| අනු අංකය | විෂයය | කාලය | විෂයය අංකය |
|---|---|---|---|
| 01 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 14 |
| 02 | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 15 |
| 03 | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය | පැය 03 යි | 16 |
| 04 | සන්ධාන (ඉංග්‍රීසි) භාෂා ප්‍රවීණතාව | පැය 03 යි | 17 |

**12.6.1 ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය - 14) (ලකුණු 100)**

ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගෙන ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි.

*සටහන* **:-** මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

1.1.2 සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය - 15) (ලකුණු 100)

පහත සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන පරිපාලනය භාර වූ ආයතන ඒවායේ ක්‍රියාකාරිත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි.

(i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රණය;
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රණය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම;
(iii) පළාත් සභා හා පළාත් පාලන ආයතන;
(iv) මහජන සංවිධාන;
(v) රාජ්‍ය සංස්ථා.

*සටහන* :- **මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.**

**12.6.3 කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය (විෂයය අංකය - 16) (ලකුණු 100 යි)**

පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කෙරෙන ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකි:-

(i) රාජ්‍ය ආයතන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේ වැදගත්කම;
(ii) දත්ත විශ්ලේෂණය හා වාර්තා සැකසීම;
(iii) දත්ත සමුදාය කළමනාකරණය හා තොරතුරු ආපසු ලබා ගැනීම;
(iv) ව්‍යාපෘති කළමනාකරණයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය;
(v) කළමනාකරණ තොරතුරු පද්ධති සැකසීම.

*සටහන* :- **මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.**

**12.6.4 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව (විෂයය අංකය - 17) (ලකුණු 100 යි)**

Scheme of Evaluation : Written Examination
Content : The following subjects area are suggested for the candidates' reference.

- Communication Skills

The candidate should possess the ability to function effectively in the following language functions:

- General Greetings and Introductions
- Giving and Getting Information
- Advising, Suggesting and Expressing Opinions
- Describing Events and Situation
- Telephone Skills
- Interviewing Skills
- Expression Skills
- Listening and Note Taking Skills

- Writing Skills

The Knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Internal Modes of Communication
- Formal Correspondence Skills
- Writing Descriptions/ Explanation
- Grammar
- Summary Writing Skills
- Report Writing Skills
- Meeting Minutes/ Agendas/ Invitation

- Comprehension Skills

Candidate's ability to comprehend a printed text infer meaning and verbal/ written interpretation is expected

- Reading and understanding the specific and general meaning of a printed text
- Reading and interpretation (verbal/written)
- Understanding the cohesion and coherence of a passage

සටහන :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

12.7 ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය: (අංක 1670/33 හා 2010.09.10 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 04 පරිශිෂ්ඨය)

මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහාවන විෂයයන් පහත දැක්වේ.:

| *අනු. අංකය* | *විෂය* | *කාලය* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01. | කළමනාකරණ ගණකාධිකරණය | පැය 03 | 18 |
| 02. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 03 | 19 |
| 03. | කළමනාකරණය හා සංවිධානය | පැය 03 | 20 |

12.7.1 **කළමනාකරණ ගණකාධිකරණය (විෂය අංක - 18) - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. ( ලකුණු 100)**
ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

ගිණුම් ප්‍රතිපෝෂක පිළිබඳ පාලන න්‍යාය, විවෘත සහ සංවෘත, මූලික හා ව්‍යවහාරික ප්‍රශස්ත, සම්මත පිරිවැය ක්‍රම, කාර්යඵල ප්‍රමිති සහ ඇගයීම ප්‍රමිති පිළිබඳ මූලධර්ම හා ඒවා යොදා ගැනීමේ ව්‍යවහාර ක්‍රම, ප්‍රමිති සංශෝධනය, ඉගෙනුම් වක්‍ර සහ අභිප්‍රේරණය නිර්ණය කිරීම, විචලනයන් සහ උපවිචලනයන් විශ්ලේෂණය කිරීම, ඒවායේ වැදගත්කම, ඉදිරිපත් කිරීම සහ විභාග කිරීම, පාලන ගණකාධිකරණයේ චර්යාන්ත අංගයන්, අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්පය, අයවැය පාලනය පිළිබඳ පරිපාලනය, අයවැය ලේඛන සංග්‍රහය, ස්ථාවර හා නම්‍ය අයවැය ලේඛන, ප්‍රධාන සහ අතුරු අයවැය ලේඛන, අයවැය කේන්ද්‍ර, අයවැය පිළියෙල කිරීමෙහිලා කළමනාකරණ සහභාගිත්වය, මැදිහත්වීම සහ අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධකය හඳුනා ගැනීම.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

12.7.2 **රාජ්‍ය මූල්‍ය කළමනාකරණය (විෂය අංක - 19) - පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. ( ලකුණු 100)**
ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

**රජයේ ගණකාධිකාරීවරයාගේ කාර්ය භාරය.**
රාජ්‍ය මුදල් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, මධ්‍යම ආණ්ඩුව, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන, සමූපකාර ව්‍යාපාර යනාදිය.

පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ඇස්තමේන්තු කාරක සභාව, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල, පාර්ලිමේන්තුව විසින් කරනු ලබන පාලනයන් පිළිබඳ ගැටලු.

මූල්‍ය චක්‍රය, ක්‍රමසම්පාදන වැඩ සටහන් සැකසීම, අයවැය ලේඛන සම්පාදනය, අරමුදල් අනුමත කිරීම, ගිණුම් තැබීමේ කටයුතු, වාර්තා කිරීම, ඇගයුම හා විගණනය.

ව්‍යාපෘති අගයනය කිරීම, සේවා මිල ගණන් සහ සංඛ්‍යානමය දත්ත භාවිතය, ගෙවීම් න්‍යාය සහ අපේක්ෂිත අගය තීරණය කිරීම.

පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, වට්ටම් කළ මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ඵලදා අනුපාතිකය, ව්‍යාපෘති තත්ත්වායනය, ව්‍යාපෘති සම්පාදනය සහ අගයනය කිරීම පිළිබඳව ආර්ථික මූල්‍ය හා කළමනාකරණ අංශ, සාර්ථක ලෙස ව්‍යාපෘති ඉදිරිපත් කිරීම.

වැඩ සටහන් සම්පාදනය කිරීමේ ශිල්ප ක්‍රම, ජාල විශ්ලේෂණ ක්‍රම භාවිත කිරීම, සම්පත් පැවරීම, ප්‍රවාහනය පිළිබඳ ගැටලු, ප්‍රයෝජනයට ගැනීම හෝ කාලයාගේ ඇවෑමෙන් පිරිහීමට පත් වන වත්කම් සහ එසේ පිරිහීමට පත් නොවන, එහෙත් යම් කලක් පාවිච්චි කිරීමෙන් හෝ කලක් ගතවීමෙන් පසුව හෝ නිශ්ඵල බවට පත්වන වත්කම් වෙනුවට වත්කම් යෙදීම, කාර්ය සාධන අයවැය ලේඛන, මූලික ක්‍රම ස්ථාපනය සහ භාවිතය, කාර්ය සාධනය මැනීම, මිණුම් වර්ග, ඒකක සහ ප්‍රතිමාන තේරීම, මිනුම් ක්‍රම සහ කාර්ය සාධන විශ්ලේෂණය.

වැඩ සටහන් අයවැය, වැඩ සටහන් ව්‍යුහය, කාර්යන් අනුව වර්ගීකරණය, වැඩ සටහන් කටයුතු, වැය ව්‍යාපෘතීන් සහ වැය විෂයයන්, ආර්ථික සහ කාර්ය බද්ධ වර්ගීකරණය.

මූල්‍ය පාලන ක්‍රම, වගකීම් භාරය, අභ්‍යන්තර පාලනය සහ මුදල් රෙගුලාසි, අභ්‍යන්තර විගණනය, කාර්යක්ෂමතා විගණනය, කළමනාකරණ විගණනය, විචල්‍යතා විශ්ලේෂණය, ප්‍රාග්ධන අයවැය සම්පාදනය කිරීම පිළිබඳ තීරණය, දිගුකාලීන ක්‍රම සම්පාදනය සහ එහි වැදගත්කම, පූර්වකථනය කිරීම, නිරවද්‍යතාව සහ සීමාවන්, අවදානම් විශ්ලේෂණය, තීරණ වෘක්ෂ, සම්භාවිත සාධක.

ප්‍රාග්ධනය සඳහා ඉල්ලුම, ප්‍රාග්ධන ඵලදායිකත්වය සහ ඉපයුම් ඇස්තමේන්තු කිරීම පිළිබඳ ගැටලු, ව්‍යාපෘති ප්‍රමුඛතාවන් තත්ත්වායනය කිරීමේ දී අවිනිශ්චිතතාවන් සඳහා ඉඩ තැබීම, පිළිගෙවුම් නිශ්චායකයන්, ඵල

අනුපාතිකය ගණනය කිරීම, ශුද්ධ වර්තමාන අගය සහ වට්ටම් කළ මුදල් ප්‍රවාහයේ ප්‍රතිලාභ, අයබදු ගැනීමේ බලපෑම, ආයෝජන ප්‍රෝත්සහනය, ව්‍යාපෘති පිරිවැය පාලනය සහ පශ්චාත් විගණනය.

හැකියා පිළිබඳ තීරණ - නිෂ්පාදන ප්‍රකීර්ණකය, නිෂ්පාදනය කිරීම හෝ මිලට ගැනීම, විකල්ප නිෂ්පාදන ක්‍රම, කර්මාන්ත ශාලා වසා දැමීම පිළිබඳ ගැටලු, මිල කිරීමේ ප්‍රතිපත්ති සහ දායක න්‍යාය, පාරිභෝගික ඉල්ලුම් රටාවන්ගේ බලපෑම, ඉල්ලුම් නම්‍යතාව, අලෙවි කිරීමේ උපාය මාර්ග, කාර්ය සාධන ඇගයීමේ ශිල්ප ක්‍රම, ලාභදායකත්වය පිළිබඳ නිශ්චායකයන් සහ අනුපාත.

පිරිවැය වාසි විශ්ලේෂණය, කාරක ප්‍රාග්ධන කළමනාකරණය.
රාජ්‍ය වාණිජ ව්‍යාපාරවල මුදල් පාලනය, අයවැය සම්පාදනය, කළමනාකරණ වාර්තා කිරීම, ගිණුම් අර්ථකථනය සහ මුදල් අනුපාත භාවිතය.

රාජ්‍ය ව්‍යවසායන්හි මිල නියම කිරීම.

ගිණුම් සැලැස්ම අන්තර්ගත කරුණු, රජයේ වාර්තා සහ රාජ්‍ය ව්‍යාපාර.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

12.7.3 **කළමනාකරණය හා සංවිධානය (විෂය අංක - 20) පැය 3 ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100)**
ප්‍රශ්න තෝරා ගැනීමට ඉඩ දෙනු නොලැබේ.

කළමනාකරණය සහ සංවිධාන මූලධර්ම පිළිබඳ අපේක්ෂකයාගේ අවබෝධය, රාජ්‍ය අංශයේ ගැටලු සහ ප්‍රශ්න සම්බන්ධයෙන් මෙම මූලධර්ම භාවිතය මෙන්ම නවීන කළමනාකරණ උපක්‍රම සහ ශිල්ප ක්‍රම පිළිබඳ ඔහුගේ දැනුම නිර්ණය කිරීම පිණිස මෙම විෂයය අලලා ප්‍රශ්න සකස් කරනු ඇත.

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

12.8 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය: (අංක 1670/32 හා 2010.09.10 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 'ඇ' පරිශිෂ්ඨය) මෙතෙක් මෙම විභාගය සම්පූර්ණ නොකළ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

12.8.1 දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත වනු ඇත.

| *අනු. අංක* | *විෂයය* | *කාලය (පැය)* | *විෂය අංකය* |
|---|---|---|---|
| 01 | සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම | 03 | 21 |
| 02 | මූලික සාර්ව ආර්ථික විද්‍යාව | 03 | 22 |
| 03 | වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම | 03 | 23 |

12.8.2 ප්‍රශ්න පත්‍රයේ ඇති සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

<u>විභාග පටිපාටිය</u>

I. **සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම (විෂය අංකය - 21)(ලකුණු 100)**
(I) ස්වොට් විශ්ලේෂණය (SWOT)
(II) ගැටලු වෘක්ෂය
(III) තර්ක රාමු විශ්ලේෂණය

(IV) පිරිවැය - ප්‍රතිලාභ විශ්ලේෂණය
(V) පිළි ලදුව ක්‍රමවේදය
(VI) ශුද්ධ වර්තමාන අගය
(VII) අභ්‍යන්තර ඵලදා අනුපාතය
(VIII) ඡායා මිල යොදා ගැනීම

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

II. **මූලික සාර්ව ආර්ථික විද්‍යාව (විෂය අංකය - 22) (ලකුණු 100)**

(I) ජාතික ගිණුම්
(II) ආර්ථික වර්ධන වේගය
(III) සමතුලිත ජාතික ආදායම
(IV) ගුණිත ප්‍රතිවිපාකය
(V) උද්ධමනය
(VI) පොළී අනුපාතය
(VII) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(VIII) මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ හැඳින්වීමක්
(IX) වෙළෙඳ චක්‍ර

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

III. වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (විෂය අංකය - 23)(ලකුණු 100)

වර්තමාන ජාත්‍යන්තර ආර්ථික අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට සිදුවන බලපෑම (ඒ ඒ අවස්ථාවේ ඇතිවන ලෝක ආර්ථික තත්ත්වයන්ට කාලීනව ගැළපෙන මාතෘකාවලට අදාළ ව පිළිතුරු සැපයීමට සිදුවේ.)

*සටහන* :- මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

13. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙම විභාගය පැවැත්වීම සඳහා පත් කර ඇති බලධරයා පමණක් වේ. ඒ අනුව මෙම විභාගය සම්බන්ධයෙන්වන සේවා ව්‍යවස්ථා විධිවිධානවලට අදාළ ගැටලු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විෂයය පථයෙන් බැහැර බැවින් එම ආයතනයෙන් එම කරුණු විමසීම් නොකළ යුතු ය. ඒ සම්බන්ධ යම් විමසීමක් වේ නම් එය සිදු කළ යුත්තේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සේවාවට අදාළ ශාඛාව වෙතිනි.

14. මෙම විභාගය සඳහාවන විභාග කාල සටහන පහත පරිදි වේ:-

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01-I | 2025.10.04 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | 01-II | 2025.10.04 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | අපරාධ නීතිය හා සාක්ෂි නීතිය | 01-III | 2025.10.05 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| | | පරිපාලනය | 02 - I | 2025.10.05 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව | 03 | 2025.10.11 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 04 | 2025.10.11 | ප.ව. 1.00 - ප.ව. 4.00 |

| අනු. අංකය | විභාගයේ නම | විෂයය | විෂය අංකය | දිනය | වේලාව |
|---|---|---|---|---|---|
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - I | 2025.10.11 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | පරිපාලනය | 02 - II | 2025.10.11 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| 03 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - II | 2025.10.12 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | පරිපාලනය | 02 - III | 2025.10.12 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| 04 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 05 - II | 2025.10.12 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | පරිපාලනය | 02 - III | 2025.10.12 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| 05 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | රජයේ මූල්‍ය පරිපාටි | 06 | 2025.10.18 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | නීතිය හා කළමනාකරණය | 07 | 2025.10.18 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | පරිපාලනය | 02 - IV | 2025.10.19 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | 08 | 2025.10.19 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| 06 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ක්‍රමසම්පාදන සංකල්පයන් සහ විධි ශාස්ත්‍රය, ක්‍රමසම්පාදන ආයතන | 09 | 2025.10.18 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | ආර්ථික විශ්ලේෂණය හා සංඛ්‍යානය | 10 | 2025.10.18 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම | 11 | 2025.10.19 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |
| | | ආයතන රෙගුලාසි සහ රාජ්‍ය අංශයේ මූල්‍ය ක්‍රම | 12 | 2025.10.19 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | ඉංග්‍රීසි භාෂාව | 13 | 2025.10.12 | පෙ.ව. 9.00 - මධ්‍යහ්න 12.00 |

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 07 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | 14 | 2025.10.04 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | 15 | 2025.10.04 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| | | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය | 16 | අයදුම්පත් කැඳවන අවසාන දිනට පසුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රායෝගික පරීක්ෂණය පවත්වනු ලබන දිනය අයදුම්කරුවන් වෙත දැනුම් දෙනු ලැබේ. | |
| | | සන්ධාන (ඉංග්‍රීසි) භාෂා ප්‍රවීණතාව | 17 | 2025.10.05 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| 08 | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | කළමනාකරණ ගණකාධිකරණය | 18 | 2025.10.04 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| | | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 19 | 2025.10.04 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | කළමනාකරණය හා සංවිධානය | 20 | 2025.10.05 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| 09 | ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරයන් සඳහාවන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය | සංවර්ධන සැලසුම් ශිල්ප ක්‍රම | 21 | 2025.10.04 | ප.ව. 1.00 - ප.ව. 4.00 |
| | | මූලික සාර්ව ආර්ථික විද්‍යාව | 22 | 2025.10.04 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |
| | | වර්තමාන ජාත්‍යන්තර ආර්ථික හා දේශපාලන අර්බුද හා ඒවායින් ශ්‍රී ලංකා ආර්ථිකයට වන බලපෑම | 23 | 2025.10.05 | පෙ.ව. 9.00 - මධ්‍යාහ්න 12.00 |

15. 15.1 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ විෂයයන්ගේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ. :-

| *විභාගය* | *විෂයය* | *නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්* |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහාවන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය | නීතිය | බැරිස්ටර්වරයෙකු හෝ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වීම. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම. |

***සටහන 1 :*** අංක 1419/3 හා 2005.11.14 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාව යටතේ 2012.07.01 දින සිට 2013.12.23 දින දක්වා බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා ද එම සේවා ව්‍යවස්ථාවේ පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉමෙ හි සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව සඳහා ලබා දුන් නිදහස් කිරීම අදාළ වේ.

15.2 ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ අන්තර්කාලීන විධිවිධාන 1.5 (ආ) පරිදි එම ව්‍යවස්ථාව බලාත්මකවන දිනට (2012.07.01) පෙර පැවති ව්‍යවස්ථා විධිවිධාන යටතේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් විය යුතුව තිබූ නමුත් 2014.12.31 දිනට එසේ සමත් වීමට අපොහොසත්වන නිලධාරීන්, පැවති ව්‍යවස්ථාවට අනුව එක් එක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන්ට අනුරූපිවන දැනට ක්‍රියාත්මක ව්‍යවස්ථාව යටතේ පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල විෂයයන් සමත් වීමෙන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. අනුරූපී විෂයයන් පහත සඳහන් වගුවෙහි දැක්වේ.

| | අංක 1419/3 හා 2005.11.14 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 දිනැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|
| 01. | නීතිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | නීතිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 02. | පරිපාලනය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | පරිපාලනය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 03. | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 04. | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 05. | ඉංග්‍රීසි (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සන්ධාන (ඉංග්‍රීසි) භාෂා ප්‍රවීණතාව<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 06. | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 07. | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සංවර්ධන පරිපාලනය පිළිබඳ ක්‍රියාවලිය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 08. | කළමනාකරණය සහ සංවිධාන ක්‍රම<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | කළමනාකරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |

16. *ප්‍රතිඵල නිකුත් කිරීම* - මෙම විභාගයට අයදුම් කළ / පෙනී සිටි සියලු අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙබ් අඩවියෙ හි පළ කරනු ලැබේ. ඉලෙක්ට්‍රොනික ලේඛන හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය පිළිබඳව වූ ජනාධිපති ලේකම්වරයාගේ අංක : SP/SB/1/13 හා 2009.10.13 දිනැති චක්‍රලේඛය අනුව අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල පළ කිරීම නිලධාරීන්ට ප්‍රතිඵල නිකුත් කිරීමක් ලෙස සැලකිය යුතුය. මේ අනුව දෙපාර්තමේන්තු ප්‍රධානීන් අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් ප්‍රතිඵල ලේඛනවල අදාළ පිටපත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කළ යුතුය. ප්‍රතිඵල නැවත සමීක්ෂණයට අවසර දෙනු නොලැබේ.

17. මෙම විභාග නිවේදනයට විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

18. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන් හි භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක දී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 අගෝස්තු මස 13 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08-237